**සිසිර දිසානායක**




වසර පුරාවට මෙල්බන් නුවර පැවැත්වෙන අපගේ කලා කටයුතු බොහෝමයි. වසර අවසානයේදීත් මුලදීත් හැරුණකොට අන් කවර කාල වකවානුවක වුවද එවැන්නක් සංවිධිනය නොවන සති අන්තයක් සොයා ගැනීමට පවා නොහැකි තරම්. මේවා අතර සංගීත ප්‍රසංගවලට හිමි වන්නේ මුල් තැනක්. මෙරට අප අතර සිටින ගායන ලෝලීන්ගේ ප්‍රසංගවලට වඩා මව් බිමෙන් මෙහි පැමිණෙන ප්‍රසංග ගණනින් ඉහළ යයි. මේ අතර පොදු අරමුණක් වෙනුවෙන් සංවිධානය කෙරෙන සංගීත ප්‍රසංග ද වෙයි.

ඩැංඩිනොංහි ධම්මදීප භාවනා මධ්‍යස්ථානයට අනුබද්ධිතව පැකිනම් ප්‍රදේශයේ අභිනවයෙන් ඉදි කෙරෙන විහාරස්ථානයට අරමුදල් රැස් කර ගැනීමේ අරමුණින් ''ධම්මදීප මෙඩිටේෂන් ඕර්ගයි-සේෂන්'' සංවිධානය කරන ටී.එම්. ජයරත්න ගායන ශිලිපියාණන්ගේ ''සොඳුරු අතීතය'' සංගීත ප්‍රසංගය අප්‍රෙල් මස දෙවන දා වේදිකා ගත වෙයි. ජෝජ්වුඩ් පර්ෆෝමිං ආට් සෙන්ටර් හි පැවැත්වෙන මේ ප්‍රසංගය වෙනුවෙන් සංගීතය මෙහෙයවන්නේ ඉන්ද්‍රජිත් මිරිහාන යොවුන් සංගීත අධ්‍යක්ෂවරයායි.

ප්‍රදේශයේ බොදු දන වෙනුවෙන් අගනා ආගමික මෙහෙවරක යෙදෙනා පූජ්‍ය ගරු අකරවිට සංඝානන්ද හිමිපාණන් ස්වකීය විහාරස්ථානයේ දියුණුව වෙනුවෙන් සංවිධානය වන ප්‍රසංගය පිළිබඳව අපව දැනුවත් කරමින් තමන්වහන්සේගේ හඬ අවධි කළේ මෙසේයි.

''අපේ විහාරස්ථානයේ ඩැංඩිනොං ප්‍රදේශයේ අරඹලා දැනට වසර විස්සක් පමණ ගතවෙලා තියෙනවා. ඉතින් හැම දෙනාගේම බලවත් ඕනකමක් තිබුණා මෙහි පැමිණෙන ජනතාවට ඉඩ කඩ ප්‍රමාණවත් නැති නිසා විශාල පරිසරයක පූජ්‍යස්ථානයක් ගොඩ නගා ගැනීමට. ඒ නිසා හැකිනම් ප්‍රදේශයේ අක්කර 10 ක භූමි භාගයක් අභිනව විහාරස්ථානය ගොඩ නැගීම සඳහා මිළදී ගත්තා. මෙහිදී හැම දෙනාගේම දායකත්වය ලැබුණ නිසා අපට පුළුවන්කම ලැබුණා බැංකුවකට ණය නොවී ඒ භූමිය ලබා ගන්න''.

''ඒ භූමිය ලබාගත්තට පස්සෙ දැනට පවතින තත්වයට පත් කරගැනීමට යම් යම් දේ කිරීමට සිදු වුණා. දැනට විහාරයක් හැටියට කුඩා ප්‍රමාණයට ගොඩනැගිල්ලක් ආහාර පාන සකස් කිරීමට කුස්සියක්, ස්වාමීන් වහන්සේලාට වැඩ සිටීමට ආවාසයට අවශ්‍ය හසුකම් සහ පිවිසුම් මාර්ග වැනි දේ සකස් කර ගැනීමට අපට හැකියාව ලැබුණා''.

ස්වාමීන් වහන්සේ තවදුරටත් පැහැදිළි කරමින්,

''විහාරස්ථානයට සෙනග යන එන ආකරය සැළකුවහොත් ඒ ආගමික වතාවත් කිරීමට භික්ෂූන් වහන්සේලා දෙනමක් වත් මෙම ස්ථානයේ වැඩ විසීම අවශ්‍ය වෙනවා. ඒ නිසා ස්වාමීන් වහන්සේලා දෙනමක් වැඩ සිටිනවා. ඒ අතරේදී අපි ලංකාවෙන්ත තවත් ස්වාමීන් වහන්සේලා කීප නමක් වැඩම කරවා විශේෂ භාවනා වැඩසටහන්, ධර්ම දේශනා කටයුතු ක්‍රියාත්මක කළා.□

''ඉදිරි වැඩ සටහන් වලට මේ ගොඩනැගිලි ප්‍රමාණවත් නැහැ. විශාල ඉඩමක් අපි ලබාගත්තේ ම ධර්ම ශාලාවක්, විහාර මන්දිරයක්, බෝධිඝරයක්, ධාතූන් වහන්සේලා සහිත චෛත්‍යයක් ඉදිකිරීමේ බලාපොරොත්තුවෙන්. මේ නිසා ම අපේ දායක සභාවට අමතරව ''ධම්මදීප මෙඩිටේෂන් ඔර්ගනයිසේෂන්'' කියලා තවත් සංවර්ධන සමිතියක් ආරම්භ කළා. මේ සමිතියේ අරමුණු තමයි මේ ගොඩනැගිලි ඉදිකිරීමට අවශ්‍ය කරන ප්‍රතිපාදන සෙවීමට සහ පිංකම් ආදිය සංවිධානය කිරීමට පිරිස එකතු වීම. ඒ සමිතියේ ව්‍යාපෘති කීපයක් ම කළා. ප්‍රතිපාදන රැස්කරගැන-මට''. ස්වාමීන්වහන්සේ ප්‍රසංගය පිළිබඳව අවධානය කළේ මෙසේ ''මේ අවස්ථාවේදී ප්‍රවීණ, ජනප්‍රිය ගායන ශිල්පියෙකු විදියට වසර ගණනාවක සිට අප දැන හඳුනාගෙන තියෙන ටී.එම්. ජයරත්න මහත්මා මේ රටට ගෙන්වාගෙන ඒ මහත්මයා ලංකාවේදීත් පවත්වපු ''සොඳුරු අතීතය'' කියන ප්‍රසංගය පවත්වා අපේ ඉදිකිරීම් සඳහා අනුග්‍රහයක් ලබා ගන්නට අප සිතුවා''.

හැත්තෑව දශකයේ මුල් භාගයේ ගුවන් විදුලියේ පර්යේෂණ අංශයෙන් විකාශනය කළ පර්යේෂණ ගී ගයමින් රසික දෙසවන් සනහා හද බැඳගත් ටී.එම්. ජයරත්නයන් සංගීතාචාර්යවරයෙකු ලෙස වෘත්තිය අරඹා ඇත්තේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ධූර පවා හෙබවීය. ගැඹුරු, ලයාන්විත හඬින් අර්ථවත් ගී රැසක් ම ගයමින් හෙළ ගී පුරාවතට එක් වන ටී.එම්. ජයරත්නයන් චිත්‍රපට වෙනුවෙන් ගැයූ ඇතැම් ගී ඉතා සංකීර්ණ වූ ගායනා වීය. ආචාර්ය ප්‍රේමසිරි කේමදාසයන්ගේ මියැසි රටා හඬගනිමින් ද, ලයනල් රන්වල ශූරීන්ගේ ජන ගී ගායනා හඬගන්-වමින් ද වඩා සමබර දායකත්වයක් හෙළ ගීයට එක්කළ ප්‍රවීණයෙකි ටී.එම්. ජයරත්නයන්.

පූජ්‍ය ගරු අකරවිට සංඝානන්ද ස්වාමීන් වහන්සේ ටී.එම්. ජයරත්නයන්ගේ "සොඳුරු අතීතය" ප්‍රසංගය නැරඹීමට රසිකයින් වෙනුවෙන් ආරාධනය කළේ මෙලෙසින්; "ඒ ප්‍රතිපාදන සකස් කරගැනීමට අපේ කමිටුව උනන්දුවෙන් මේ ප්‍රසංගය සංවිධානය කරගෙන යනවා. සෑම කටයුත්තකදීම මේ ප්‍රසංගය සංවිධානය කරගෙන යනවා. සෑම කටයුත්තකදීම මේ විදියට උර-දෙන්නේ දායක පිරිස. ඉතින් කාට වුණත් වැඩි බරක් නොදී කටයුතු කරන එකත් වැදගත්. ඒ නිසා මේ අවස්ථාව ගොඩනැගිලිවල අවශ්‍ය දේ සම්පාදනය කරගන්නා අවස්ථාවක් නිසා කාගේත් සහයෝගය ශ්‍රී ලාංකික බෞද්ධයින් හැටියට අපට ලැබේවි කියලා අපේක්ෂා කරනවා. තෙරුවන් සරණායි !

පූජ්‍ය ගරු අකරවිට සංඝානන්ද ස්වාමීන් වහන්සේට අනුව "සොඳුරු අතීතය" ප්‍රසංගය සාර්ථක වේවා! යි අපි සුබ පතන්නෙමු.

D&M Lawyers

Like our clients our lawyers come from diverse backgrounds and bring a wealth of different experiences and expertise.

723 High Street Epping 3076
Waterman Business Centres "SixtyFourOnVictor"
64 Victor Crescent Narre Warren VIC 3805

D&M Lawyers is a boutique law firm located in Epping and Narre Warren

OUR TEAM



Suliaka Dhanapala
Principal
Barrister & Solicitor
Migration Consultant, MARN: 0210877



Rohan D Wijesinha
Senior Solicitor
Migration Consultant MARN:1463572

Legal Aid available, if applicable
Language spoken: English, Sinhalese, Italian and Macedonian
All other languages available through interpreters




FIRST CONSULTATION
FREE
*Conditions Apply

Our areas of expertise include

Property & Conveyancing
Immigration Law
Intervention Orders
Family Law
Wills & Powers of Attorney
VOCAT - Victims of Crime CompansationCriminal Law
Civil Law

CONTACT US
(03) 9408 0837 or via email at admin@dandmlawyers.com.au
www.dandmlawyers.com.au